# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,774 — 1961 නොවැම්බර් 15 වැනි බදාදා — 15.11.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

### විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

#### අංක 40/61 දරන ආනයන පාලන දැන්වීම

කෝස්ටික් සෝඩා ආනයනය

ඕනෑම ප්‍රදේශයකින් කෝස්ටික් සෝඩා ආනයනය සඳහා පෞද්ගලික ආනයන බලපත්‍රයක් දැන් අවශ්‍ය බව ආනයනකයන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. සියලුම නොනිමි ඇණවුම් වහාම අවලංගු කළ යුතුයි.

3. අදාල ආනයන බලපත්‍රයක් ප්‍රථමයෙන් නොලබා කවර ප්‍රභවස්ථානයකින් වුවද මෙම බඩු ඇණවුම් කිරීම හෝ නොනිමි ඇණවුම්වල බඩු නැව්ගත කිරීම හෝ කිසිම ආනයනකයකු විසින් නොකළ යුතු වේ.

4. 1960 ආනයන මත පිහිටා පාලකගේ අභිමතය පරිදි කෝස්ටික් සෝඩා ආනයනයට බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ඊ. එස්. ද සිල්වා,
වැඩ බලන ආනයන හා අපනයන පාලක.

1961 නොවැම්බර් මස 14 වෙනි දින,
කොළඹදී ය.

11–779/5

---

#### අංක 41/61 දරන ආනයන පාලන දැන්වීම

ගෙන්දගම් හා සල්ෆේට් ඔෆ් ඇමෝනියා ආනයන

ලාංකික රටවල හා ඩොලර් රටවල උපදින ගෙන්දගම් හැර අනිකුත් රටවල උපදින ගෙන්දගම් ආනයනයට දැන් බලපත්‍රයක් අවශ්‍ය නැති බැව් ආනයනකයන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. ලාංකික රටවල හෝ ඩොලර් රටවල හෝ උපදින ගෙන්දගම් ආනයනය සාමාන්‍ය ආනයන බලපත්‍ර ක්‍රමය යටතේ සිදුකළ හැක.

ලාංකික රටවල හැර අනිකුත් රටවල උපදින සල්ෆේට් ඔෆ් ඇමෝනියා ආනයනයට ද දැන් බලපත්‍රයක් අවශ්‍ය නැත. ලාංකික රටවල උපදින සල්ෆේට් ඔෆ් ඇමෝනියා ආනයනය සාමාන්‍ය ආනයන බලපත්‍ර ක්‍රමය යටතේ සිදුකළ හැක.

ඊ. එස්. ද සිල්වා,
වැඩ බලන ආනයන හා අපනයන පාලක.

1961 නොවැම්බර් මස 14 වෙනි දින,
කොළඹදී ය.

11–779/6

ලංකාවේ වැලව්වත්තෙහි පිහිටි "ඊස්ටන් පේපර් මිල්ස් කෝපරේෂන්", හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රාපිතයි.

2093—ජේ. ඇන්. ආර් 6—5,100 (11/61)